ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ප්‍රවෘත්ති සංස්කාරක 2023 අගෝස්තු 21

# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2021 = 100) : 2023 ජූලි

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

දුරකථනය: **011-2147414** ෆැක්ස්: **011-2877945** ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ 2013=100 වූ දර්ශක යොමු කාලය 2023 ජනවාරි මාසයේ සිට 2021=100 වන නව දර්ශක යොමු කාලයට යාවත්කාලීන කර ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2023 ජූලි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 4.6%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2023 ජූනි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 10.8%ක් ලෙස වාර්තා විය. 2023 ජූලි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ -1.2%ක හා ආහාර නොවන කාණ්ඩයේ 5.7%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. ආහාර කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2023 ජූනි මාසයේදී 2.5% සිට 2023 ජූලි මාසයේදී -2.5% දක්වා අඩු වූ අතර, ආහාර නොවන කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2023 ජූනි මාසයේදී 18.3% සිට 2023 ජූලි මාසයේදී 10.9% දක්වා අඩුවිය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (2021=100) මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2023 ජූනි මාසයේ 203.3ක් වූ දර්ශකාංකය 2023 ජූලි මාසයේ දී 201.9ක් දක්වා අඩුවීමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කල විට 2023 ජූලි මාසයේ දර්ශකාංකය 1.4ක අඩුවීමක් එනම් 0.7ක ප්‍රතිශතාංක අඩුවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 0.17% කින් සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 0.53% කින් අඩුවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකූවිට පොල්, එළවළු, පොල්තෙල්, සහල්, බිස්කට් වර්ග, පාන් (සාමාන්‍ය), මයිසූර් පරිප්පු, කිරිපිටි, මිරිස්කුඩු, අළුත් මාළු, මුංඇට, බනිස්, වියළි මිරිස්, තිරිඟුපිටි, සහල්පිටි, නූඩ්ල්ස් සහ කහකුඩු යන ආහාර ද්‍රව්‍යවල මිලෙහි අඩුවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත. එහෙත් අමුමිරිස්, අර්තාපල්, බිත්තර, ලොකුළූණු, අළුත් පළතුරු, කුකුල්මස්, කරවල, තේ කොළ/කුඩු, රතුළූණු, සීනි, සුදුළූණු, ඉඟුරු සහ ටින්මාළු යන ආහාර ද්‍රව්‍ය වල මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2023 ජූලි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය අඩුවීම සඳහා 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' (*විදුලි බිල හා එල්.පී. ගෑස්*), 'සෞඛ්‍ය' (ඖෂධ නිෂ්පාදන මිලදී ගැනීම), 'රෙදිපිළි හා පාවහන්' (*රෙදිපිළි*) යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එහෙත් 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' (අරක්කු හා දුම්වැටි), 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', 'ප්‍රවාහන' (*පෙට්‍රල්*), 'විනෝදාත්මක හා සංස්කෘතික' (ලොතරැයි, අභ්‍යාස පොත් හා ලිපිද්‍රව්‍ය), 'අධ්‍යාපන' (පෞද්ගලික පන්ති ගාස්තු), 'ආපනශාලා සහ හෝටල්' සහ 'විවිධ භාණ්ඩ හා සේවා' යන කාණ්ඩයට අයත් අයිතමයන්ගේ මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත. එමෙන්ම 'සන්නිවේදන' කාණ්ඩයට අයත් අයිතමයන්ගේ මිල ජූලි මාසය පුරා නොවෙනස්ව පැවති බවත් වාර්තා වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (පාද වර්ෂය: 2021=100) ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්ඡාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිබිඹු වන යටිදැරි උද්ධමනය (Core Inflation), 2023 ජූනි මාසයේ 11.3% සිට 2023 ජූලි මාසයේදී 6.3% දක්වා අඩුවීමක් වාර්තා විය.




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2021 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය: ජා.පා.මි.ද. (මතුපිට) සියළුම අයිතම | දර්ශකාංකය: ජා.පා.මි.ද. (මතුපිට) ආහාර | දර්ශකාංකය: ජා.පා.මි.ද. (මතුපිට) ආහාර නොවන | දර්ශකාංකය: ජා.පා.මි.ද. (යටිදැරි) | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%): ජා.පා.මි.ද. (මතුපිට) | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%): ජා.පා.මි.ද. (යටිදැරි) | ලක්ෂ්‍යමය උද්ධමනය (%): ජා.පා.මි.ද. (මතුපිට) සියළුම අයිතම | ලක්ෂ්‍යමය උද්ධමනය (%): ජා.පා.මි.ද. (මතුපිට) ආහාර | ලක්ෂ්‍යමය උද්ධමනය (%): ජා.පා.මි.ද. (මතුපිට) ආහාර නොවන | ලක්ෂ්‍යමය උද්ධමනය (%): ජා.පා.මි.ද. (යටිදැරි) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2022 | ජූලි | 193.1 | 233.4 | 167.1 | 176.8 | 5.2 | 5.6 | | | | |
| | අගෝ. | 197.7 | 237.5 | 171.9 | 181.2 | 2.4 | 2.5 | | | | |
| | සැප්. | 201.9 | 239.1 | 178.0 | 185.9 | 2.1 | 2.6 | | | | |
| | ඔක්. | 201.6 | 236.5 | 179.1 | 188.0 | -0.1 | 1.1 | | | | |
| | නොවැ. | 200.3 | 233.2 | 179.1 | 187.8 | -0.6 | -0.1 | | | | |
| | දෙසැ. | 200.4 | 232.4 | 179.8 | 188.0 | 0.0 | 0.1 | | | | |
| 2023 | ජන. | 201.8 | 232.8 | 181.8 | 189.8 | 0.7 | 1.0 | 53.2 | 53.6 | 52.9 | 52.0 |
| | පෙබ. | 204.1 | 228.1 | 188.6 | 189.4 | 1.1 | -0.2 | 53.6 | 49.0 | 57.4 | 50.1 |
| | මාර්තු | 204.8 | 223.2 | 193.0 | 188.1 | 0.3 | -0.7 | 49.2 | 42.3 | 54.9 | 44.2 |
| | අප්‍රේල් | 202.7 | 223.8 | 189.1 | 188.2 | -1.0 | 0.1 | 33.6 | 27.1 | 39.0 | 31.8 |
| | මැයි | 203.1 | 226.1 | 188.3 | 187.8 | 0.2 | -0.2 | 22.1 | 15.8 | 27.6 | 21.6 |
| | ජූනි | 203.3 | 228.4 | 187.1 | 186.5 | 0.1 | -0.7 | 10.8 | 2.5 | 18.3 | 11.3 |
| | ජූලි | 201.9 | 227.5 | 185.3 | 188.0 | -0.7 | 0.8 | 4.6 | -2.5 | 10.9 | 6.3 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව